# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 54 — 1973 අප්‍රේල් 06 වැනි සිකුරාදා — 1973.04.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කොටසකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 447 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 459 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |



## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කළුතර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

පහත සඳහන් වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන්, ග්‍රාම සංවර්ධන හා සමුපකාර සමිතිවලින් ටැන්ඩර් කැඳවනු ලැබේ :—

(1) මාදුවුගල ජනපද පාර.
(2) තෙළුව හල්වල හේන පාර.
(3) මතුගම්කන්ද ජනපද පාර.
(4) දෙඩම්පාපිටිය-රිල්ලපල-පරෙයිගම පාර.
(5) මාවල ජනපද පාර.

2. එක් එක් වැඩය සඳහා වෙන වෙනම ටැන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පත්‍ර දිසාපති කායර්‍යාලයේ තබා ඇති ටැන්ඩර් පෙට්ටියේ හෝ නියමිත දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කළුතර දිසාපතිට ලැබෙන සේ එවිය යුතුය.

3. ටැන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ වැඩයේ නම ලියා 73.04.23 වැනි දින පස්වරු 1 ට පෙර ලැබෙන සේ තැපෑලෙන් එවිය යුතුය. නැතිනම් ටැන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. ටැන්ඩර් පත්‍ර 73. 04. 23 වැනි දින පස්වරු 1.30 ට විවෘත කරනවා ඇත. එදින එම වේලාවේදී ටැන්ඩර් කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

4. ටැන්ඩර් ආකෘති පත්‍ර 73. 04. 19 වැනි දින පස්වරු 2 දක්වා කළුතර දිසාපති කායර්‍යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝරමයේ ඉදිරිපත් කරනු නොලබන ටැන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් විසින් එවනු ලබන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කපාහැරීම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

6. ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 10 කළුතර දිසාපති කායර්‍යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

7. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාර ගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරණ ලද මුදල් රාජසන්තක කරනු ලැබේ.

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ)** වැනි ඡේදයන්හි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට **පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු** නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

8. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් හෝ ඒ දැන්වීම් ටෙන්ඩර් කරුට ලැබුනාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත් අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරණ ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට 'වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

10. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමණින්ම රජය කෙරෙහි පවතින්නේ ය.

11. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේ ය.

12. රජය වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම, ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ඊ. අයි. ප්‍රනාන්දු,
කළුතර දිසාපති වෙනුවට.

1973 මාර්තු මස 26 වැනි දින,
කළුතර, දිසාපති කායාලයේදී ය.

4–90—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**මිනුම් දෙපාර්තමේන්තුව**

1973 වර්ෂයේ ගිග්කුඩ අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

1973.03.02 වෙනි දින අංක 49 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබූ ඉහත සඳහන් ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 1973.04.27 දින පෙරවරු 10 දක්වා දීර්ඝ කර ඇති අතර, එදින පෙරවරු 10.15 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

ආර්. ජේ. මුණසිංහ,
වැඩබලන සර්වේ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 22 වැනි දින,
කොළඹ 5, කිරුල පාර, තැ. පෙ. 506,
සර්වේ ජනරාල් කාර්යාලයේ ගිණුම් අංශය.

4–1—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

නාත්තන්ඩිය බලවේග පෝෂකර්ම ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින්, 1973.04.26 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 25,000කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, 1973.04.25 දින පෙ. ව. 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබාගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

යොමුව :3/1/(1/40).
1973.03.27,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

4–125—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියඟින් පෙළෙන ගම්වලට බීමට ජලය සැපයීම—1973**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් අනුමත කරනු ලබන, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්වලට බීමට ජලය සැපයීම සඳහා ලොරි අයිතිකරුවන්ගෙන් 1973 මැයි 21 වැනිදා ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ඉහත සඳහන් වේලාවෙන් පසු ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන හෙයින් ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා හම්බන්තොට කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක රු. 10 ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. 1973 මැයි 6 වැනිදා ප. ව. 2 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කෙරේ.

3. ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ බීමට ජලය සැපයීම" යනුවෙන් සඳහන් කොට කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. සැම දුවන තනි සැතැප්ම කට අය කරන ගාස්තුව පමණක් ටෙන්ඩර් පත්‍රවල අකුරෙන් හා ඉලක්කමෙන් ලිවිය යුතුය.

4. ජලය සැපයීමට තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් එක ගමනකට යටත් පිරිසෙයින් වතුර ගැළුම් 800 ක් වත් ප්‍රවාහණය කළ යුතුය. දිසාපතිතැනගේ නියමයන් අනුව සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා රු. 500 ක ඇප මුදලක් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුය. තෝරාගත් ටෙන්ඩර්කරුට සතුටුදායක ලෙස ජලය සැපයිය නොහැකි වුවහොත් ඉහතකී ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

5. ජලය සැපයීමට තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් දිසාපති තැනගේ නියමයන් අනුව ජලය සැපයිය යුතුය. දිනපතාම ජලය සැපයිය යුතුයයි ස්ථිර වශයෙන්ම කිව නොහැකිය. ජලය සැපයීම පෙ. ව. 6 සිට ප. ව. 6 දක්වා කාලය තුළ කළ යුතුය.

6. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු තමන් විසින් සපයාගනු ලැබූ පිරිසිදු ගැල්වනයිස් ටැංකිවල හෝ බවුසර්වල වතුර පුරවා ගෙන යා යුතුය. සාමාන්‍යයෙන් අම්බලන්තොට, නලගම සහ කතරගම ජලය සැපයීමේ මධ්‍යස්ථානවල සිට ජලය ප්‍රවාහණය කළ යුතුවේ. අවශ්‍ය වුවහොත් අන් කිසි ස්ථානයක සිට වුවද ජලය ප්‍රවාහනය කරන ලෙස ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ඇත.

7. බෙදීමේ ප්‍රමාණය එක් පුද්ගලයෙකුට දිනකට වතුර ගැලුම් භාගයක් (½) වන අතර පවුලකට ගැලුම් පහකට නොවැඩිවන ලෙසය. සෑම ගමකටම දින දෙකකට වරක් වතුර බෙදිය යුතු අතර කලින් කල හම්බන්තොට දිසාපති විසින් නියම කරන ලද ගම්වලට වතුර බෙදා දිය යුතුය.

8. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුය. කිසියම් කාර මෙම කාර්යය ඉටු කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුට නොහැකි වූ විට හෝ නිසියාකාර එය කළ නොහැකි බව ඔහු විසින් ලියවිල්ලකින් දැන්වීමෙන් පසු ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට තමාගේ අභිමතය පරිදි ජලය ප්‍රවාහනය කිරීමට ආණ්ඩුවේ ඒජන්ත තැනට බලය තිබේ.

9. කිසි කරුණක් නොපෙන්වා ටෙන්ඩර්පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමට ආණ්ඩුවේ ඒජන්ත තැනට බලය තිබේ.

10. ටෙන්ඩර් කැඳවා භාරගත් ටෙන්ඩර්කරුට එම කාල සීමාවේදී මෙම වැඩය භාර නුදුනහොත් ඒ සම්බන්ධයෙන් කිසියම් අලාභයක් ඉල්ලීමට ඉඩ නොලැබේ.

කේ. ඒ. කරුණාරත්න,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ
ආණ්ඩුවේ ඒජන්ත තැන වෙනුවට.

1973 මාර්තු 20 වැනිදා,
හම්බන්තොට කච්චේරියේ දී ය.

4–89—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

### ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට අවශ්‍ය මෙරට නිෂ්පාදිත විදුලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය :—දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10.) 1973 මැයි මස 8 වැනි අඟහරුවාදා පෙ. ව. 11 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට හා හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස, ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම කොළවල ටෙන්ඩරය ලියා අනු පිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 මැයි මස 5 වැනි සෙනසුරාදා පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 මැයි 8 වැනි අඟහරුවාදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
1973 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

4–96—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට අවශ්‍ය වියලි හුණු, තම්බාපු හුණු, ගිරිගල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1973 මැයි මස 4 වෙනි සිකුරාදා පෙ. ව. 11 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට හා හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 මැයි මස 3 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 මැයි මස 4 වෙනි සිකුරාදා පෙ. ව. 11.05ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
1973 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දීය.

4–126—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත් 73. 5. 3 වෙනි දින ප. ව. 1.30 පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ඉංජිනේරු අංශයේ) ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාර ගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සැපයීම් විස්තර | අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|
| එම්.ඊ/2/727305 ... | ගවයින් කිරීමේ තරාදියක් ... | 25 | 0 |
| එම්.ඊ/3/727306 ... | සීතකරණ යන්ත්‍ර 3යි ... | 25 | 0 |
| එම්.ඊ/3/727307 ... | තණ කැපීමේ යන්ත්‍ර 2යි ... | 25 | 0 |
| එම්.ඊ/3/727308 ... | හොණ්ඩර 10යේ බර කිරීමේ තරාදියක් ... | 25 | 0 |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීම කළ යුතු අතර එක් එක් විෂය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීම කළ යුතුය.

3. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර ඒවා තැන්පත් කොට කවරයක බහා එහි වම්පස උඩ කෙළවරේ " යන්ත්‍රෝපකරණ සඳහා ටෙන්ඩර්—එම්. ඊ/3/727305/06/07/08—භාර ගැනීමේ අවසාන දිනය 73.5.3 " යන්න සඳහන් කොට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. 1973.4.30 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඊට පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු නො ලැබේ. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩරය සඳහා නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමේ අයට මුදල් තැන්පත් කිරීමෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කිරීම හෝ එම ටෙන්ඩර් පතකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාර ගැනීමේ හිමිකම රජය සතුවේ.

6. වැඩිමනත් විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකිය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973.3.23 වෙනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ඉංජිනේරු කාර්යාලයේදීය.

4–43—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

**"හෝස්" සහ "පුට්වැල්ව්" සැපයීම සඳහා මිල ගණන් කැඳවීම**

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා පේරාදෙනියේ ගන්නොරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 මැයි මස 10 වැනි දින ප. ව. 2.30 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

| ද්‍රව්‍ය අංකය | විස්තර | ප්‍රමාණය |
|---|---|---|
| (1) | විෂ්කම්භය 4" දිග 30-0" ආමර්ඩ් හෝස් | 2 යි |
| (2) | විෂ්කම්භය 6" දිග 30-0" ආමර්ඩ් හෝස් | 4 යි |
| (3) | විෂ්කම්භය 4" ස්ට්‍රේනර් සහිත සී.අයි. fපුට්වැල්ව් | 2 යි |
| (4) | විෂ්කම්භය 6" ස්ට්‍රේනර් සහිත සී.අයි. fපුට්වැල්ව් | 2 යි |

2. දැනට මෙම ද්‍රව්‍යයන් ගබඩාවල නොමැති නම් ආනයනය කර සැපයීමට ද ඉල්ලුම් කළ හැක. ටෙන්ඩර් කරුවන් විසින් ණයවර ලිපි විවෘත කළ යුතු අතර, බදු ඉවත් කිරීමද ඔවුන් විසින්ම කළ යුතුය.

3. ටෙන්ඩර්කරුවන්ට මින් කොටසක් හෝ සම්පූර්ණයෙන් හෝ සැපයීමට ටෙන්ඩර් කළ හැක.

4. දෙපිටපතකින් සකස් කරන ලද මිල දර්ශන, හොඳින් මුද්‍රා තබන ලද කවරයක බහා, කවරය උඩ කෙළවරේ "හෝස් හා පුට්වැල්ව් සැපයීම සඳහා මිල දර්ශනය" යන්න සඳහන් කර, පේරාදෙණියේ ගන්නොරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත, 1973 මැයි මස 10 වැනි දින ප. ව. 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

5. සියළුම මිල ගනණ්, මිල ගණන් කැඳවීම් අවසාන කළ දින සිට දින 40 ක කාලයක් තුළ වලංගුව තිබිය යුතුය.

6. සියළුම ටෙන්ඩර් හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

7. වැඩි විස්තර, පේරාදෙණියේ, ගන්නොරුවේ කෘෂිකර්ම ඉංජිනේරු තැන ගෙන් විමසා දැනගත හැකිය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු).

1973 මාර්තු මස 19 වැනි දින,
පේරාදෙණියේ ගන්නොරුවේ,
ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී ය.

4–34—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

කොළඹ දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973. 04. 27 දින පස්වරු 2.30 දක්වා, කොළඹ මහලේකම් කායඹලයේ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවිදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමිණ සිටිය හැක.

| වැඩයේ ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල |
|---|---|
| කොළඹ කාසල් වීදියේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ යෝජිත වැඩපොල සෑදීම | රු. 50,000. |

2. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින්, කොළඹ ඉඩම් කොමසාරිස් කායඹලයේ ඉඩම් කොමසාරිස් තුමා නමින් අදාල වැඩය සඳහා රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉඩම් කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද මෙම වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම් මෙකී වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. අනුමත කරන ලද සමිති විසින් ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීම අනවශ්‍යය.

3. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් 2 කින් යුතුව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තැබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපැලෙන් නොඑවන්නේ නම්, මහ ලේකම් කායඹලයේ ඉඩම් කොමසාරිස් දෙපාතීමේන්තු අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. 1973. 04. 23 වැනි දින පෙරවරු 10 දක්වා පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වූ පසු සතියක් ඇතුළත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල් රාජසන්තක කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඇත්නම් ඉඩම් කොමසාරිස් කායඹලයෙන් ලබාගත හැකිය.

ඩී. ඩී. වික්‍රමතුංග,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ඉඩම් කොමසාරිස් කායඹලය,
මහලේකම් කායඹලය,
තැ. පෙ. 500, කොළඹ 1,
1973 මාර්තු මස 26 දින දීය.

4–115—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**සුරාබදු දෙපාර්තමේන්තුව**

සජීව ගස්, මිලට ගැනීම සහ ඉවත් කිරීම සඳහා වූ ටෙන්ඩරය
අංක 2 දරණ සුරාබදු ගුදම, කළුතර

කළුතර අංක 2 දරණ සුරාබදු ගුදම ඇතුළත සහ ඒ අවට තිබෙන්නාවූ සජීව ගස් මිළයට ගැනීම සහ ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, සුරාබදු කොමසාරිස් කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973 අප්‍රේල් 25 වැනි බදාදා පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ. මෙම සජීව ගස් කළුතර සුරාබදු ගුදම් අධිකාරී සමග කලින් වේලාවක් නියම කරගෙන වැඩ කරන දිනයක, කාර්යාලීය වේලාවන් තුළදී පරීක්‍ෂා කළ හැකිය.

ටෙන්ඩර් දෙපිටපතකින් යුක්ත කොට මුද්‍රා තැබූ කවරයක බහා කවරයේ ඉහළ වම් කෙළවරේ "සජීව ගස් මිළයට ගැනීම සහ ඉවත් කිරීම සඳහා වූ ටෙන්ඩරය" යනුවෙන් ලකුණු කරන ලදුව කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නමට ඉදිරිපත් කළ යුතුය.

**ටෙන්ඩර ලියාපදිංචි කළ තැපාලෙන් එවිය යුතු අතර ඒවා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් කාර්**යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත 1973 අප්‍රේල් 25 වැනි බදාදා පෙරවරු 10 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

ටෙන්ඩර 1973 අප්‍රේල් 25 වැනි බදාදා පෙරවරු 10 ට කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

ටෙන්ඩර 1973 අප්‍රේල් 24 වැනි අඟහරුවාදා පස්වරු 2 තෙක් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගත හැකි වන්නාවූ නියමිත ආකෘති පත්‍රයන්හි සකස් කළ යුතු වේ.

ටෙන්ඩර නිකුත් කිරීමට පෙර කොළඹ 1, සුරාබදු කොමසාරිස් කාර්යාලයේ හෝ කොළඹින් පිටත ඇති කච්චේරියක ආපසු ගෙවිය හැකි රු. 50 ක මුදලක් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සිය ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

ටෙන්ඩරය පිළිබඳ වූ අවශ්‍ය වෙනත් විස්තර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස්තුමාගෙන් ලබාගත හැක.

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

4–12—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

**අලෙවි දෙපාර්තමේන්තුව**

කොළඹ 1, බ්‍රිස්ටල් වීදිය, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1973 මැයි 03 වෙනි දින පස්වරු 2.00 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, ලෝටස් පාරේ, පිහිටි ශීත ගබඩාවේ බිම් මාලයේ ඇති ශීතකරණ උපකරණ වෙනුවට අලුතින් ඒවා සපයා සවි කිරීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

කොළඹ 1, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තුමා වෙත රු. 200 ක් තැන්පත් කර 1973 මැයි 03 වෙනි දින දහවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලෝටස් පාරේ, ශීත ගබඩාවේ, ඉංජිනේරු සහ අධිකාරි (දුරකථන අංක 27283) වෙතින් වැඩි විස්තර ලබා ගත හැක. ඉංජිනේරු සහ අධිකාරිගේ පෙර ලබා ගත් අවසරය අනුව සතියේ දිනයන් හි පෙරවරු 8 සිට පස්වරු 4 දක්වා සහ සෙනසුරාදා දිනයන් හි පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ශීතකරණ උපකරණ හා යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීමට පුළුවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි සංවර්ධන කොමසාරිස් වෙනුවට.

කොළඹ 1,
බ්‍රිස්ටල් වීදිය,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල,
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව,
1973 මාර්තු මස 28 දිනදීය.

4–108—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ධීවර දෙපාර්තමේන්තුව**

**නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම**

නාවික ඩීසල් එන්ජින් පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී එම ස්ථානවලදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. උප ලේඛණයෙහි සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. උප ලේඛණයෙහි සඳහන් වෙන්දේසි කිරීමේ දිනයන් කල්දැමීමට හෝ අවලංගු කිරීමට වෙන්දේසිය මෙහෙයවන නිළධාරියාට බලය තිබේ.

4. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින්ම කළ යුතුයි :—

(අ) එන්ජින් වල විකුණුම් මිළෙන් 1/4ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි 3/4 කොටස දින 3ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුව ද, යම් එන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලංසුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ දින 21 ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී, එන්ජින් වල විකුණුම් මිළෙන් 1/4ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසාන වූ වහාම ගෙවිය යුතුය. එම ලංසුව පිළිගනු ලැබුවහොත්, විකුණුම් මිළෙන් ඉතිරි 3/4ක මුදල අවසාන් පිළිගැනීමේ දන්වීම එවා දින 3ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමි වීමයි. ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

5. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

**උප ලේඛනය**

**කොළඹ දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරී කොට්ඨාශය**

| යාත්‍රා අංකය | එන්ජින් වර්ගය හා අංකය | | වෙන්දේසියට නියමිත භාණ්ඩ තිබෙන ස්ථානය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| — ... | ටෝර්පිඩෝ | 10464 | ලංකා ධීවර සංස්ථාව, යාත්‍රාංගණය, මට්ටක්කුලිය, කොළඹ 15 ... | 1973.04.24 ... | පෙ.ව. 9.30 |
| — ... | ටෝර්පිඩෝ | 10400 | | | |
| — ... | රුෂියන් | 202188 | | | |
| — ... | එම | 203189 | | | |
| — ... | එම | 202169 | | | |
| — ... | එම | 203190 | | | |
| — ... | එම | 112819 | | | |
| — ... | එම | 112621 | | | |
| එන්එල් 25 ... | ඩියුට්ස්, එස්එප් 2 එල් 712 (එන්ජිමේ කොටස් පමණයි) ... | | ධීවර දෙපාර්තමේන්තුව, භාළු මුවදෙර, කොළඹ 3 ... | 1973.04.26 ... | පෙ.ව. 9.30 |

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3,
1973 මාර්තු 23 වැනි දින.

4–86—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**පොලිස් දෙපාර්තමේන්තුවට සපත්තු ඔප දැමීමේ ද්‍රව්‍ය (පොලිෂ්) සැපයීම**

ප්‍රාදේශිකව ලබාගතහැකි මූල ද්‍රව්‍යවලින් සාදන ලද සපත්තු ඔප දැමීමේ ද්‍රව්‍ය (ලොකු ප්‍රමාණයේ පොලිෂ් ටින්) ග්‍රොස් 500ක් සැපයීම සඳහා 1973. 5. 11 දින පෙ. ව. 10.00 දක්වා කොළඹ 1, තැ. පෙ. 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථා වේදී එතනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

3. පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළියෙළ කළ යුතු ය. අවශ්‍ය ද්‍රව්‍යයේ සාම්පල සාමාන්‍ය වැඩ කරන වේලාවන් හිදී පොලිස් මූලස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 200 ක් තැන්පත් කොට ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973. 5. 10 දින දවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය. තැන්පත් මුදල් පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

5. සැම්පලයක් ඉදිරිපත් කළ යුතු ය. මෙය ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට පෙර ටෙන්ඩර්කරුගේ නම සඳහන් ලේබලයක් සමඟ පොලිස් මූලස්ථානයේ තැන්පත් කළ යුතු ය.

6. වැඩි විස්තර පොලිස් මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

4–139—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—එක් එක් ආයතනයට කෙළින්ම දන්වන ලද කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයෙහි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය. ඒ සමගම කොන්ත්‍රාත්තුව ඉටුකිරීමට තැන්පත් පිණිස මුදල්ද, කාර්ය මණ්ඩලයද තිබෙන බවට ප්‍රදේශීය ආදායම් නිලධාරියාගෙන් ලබාගත් වාර්තාව ද එවිය යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේදී ටෙන්ඩර් පත්‍ර අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන් විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හිදී පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීමට අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩු බාහිරාදිය තබාගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාර දී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
යාපනය, 1973 මාර්තු මස 23 වැනි දින.

පී. රත්නසභාපති,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

උපලේඛනය

| ආයතන | තැන්පත් | ඇප | ටෙන්ඩර් වලංගු කාලය | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | කරවල | බිත්තර | එළවළු | රෝගීන්ට: මාළු | කරවල | බිත්තර | එළවළු | ටෙන්ඩර් අවසාන වන දින |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අලවට්ටි මා. නි. | ... 100 | ... 300 | ... 1. 5.73 සිට 31.12.73 | ... 100 | ... 200 | ... 100 | ... 300 | ... 25 | ... 50 | ... 25 | ... 100 | ... 23. 4.73 |
| 2. තරවඩි | ... 100 | ... 300 | ... එම | ... 100 | ... 150 | ... 100 | ... 300 | ... 50 | ... 50 | ... 50 | ... 100 | ... එම |
| 3. පලෙයි ප. ඒ. | ... 100 | ... 600 | ... එම | ... 250 | ... 450 | ... 250 | ... 700 | ... 600 | ...1,000 | ... 600 | ...2,200 | ... එම |

4—95—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—බොරකන්ද පර්යන්ත ඒකකයට වර්ෂ 1973 මැයි මස 1 වැනිද සිට 1973 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුවූ සෞඛ්‍ය සේවා අධිකාරීන්ට ද හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡෙදයේ (ii) වන කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වෙන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—වර්ෂයකට සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දල වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල'' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවා මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයෙහි දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර හැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි, සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයුමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

යම්කිසි අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් බාර නුදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදී කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා ලද සහල් දැනට මෙන්ම නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි සහල්වලට කූපන් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරනු ලැබේ.

ඒ. බී. එන්. මොහමඩ්,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1973 මාර්තු මස 24 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දීය.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාලු | හරක් මස් | කරවල | එලවළු | බිත්තර | නොගෙවන රෝගීන්ට: මාලු | හරක් මස් | කරවල | එලවළු | බිත්තර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | | | |
| 1. බොරකන්ද පර්යන්ත ඒකකය ... | 100... | 600... | 73.5.8 දින පෙරවරු 10ට ... | 200... | 150... | 200... | 550... | 150... | 2,150... | 2,100... | 2,150... | 6,350... | 2,100 |

4-88—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : කේ සී 8/63

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රජයේ බෙහෙත් ගබඩාව**

**හිස් භාජන විකිණීම**

පහත සඳහන් හිස් භාජන විකිණීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් 1973. 4. 23 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| ද්‍රව්‍ය අංක | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | ගැලුම් 45 ස්ප්‍රිංග මූඩි සහිත හිස් පීප්ප ... | 91 |
| 2. | ගැලුම් 45 ස්ප්‍රිංග මූඩි රහිත හිස් පීප්ප ... | 81 |
| 3. | ගැලුම් 45 හිස් මූඩි රහිත පීප්ප 1 වෙනි තොගය ... | 28 |
| 4. | ගැලුම් 45 හිස් මූඩි රහිත පීප්ප 2 වෙනි තොගය ... | 31 |
| 5. | ගැලුම් 45 හිස් මූඩි රහිත පීප්ප 3 වෙනි තොගය ... | 35 |
| 6. | ගැලුම් 45 මූඩි රහිත රවුන් පීප්ප ... | 200 |
| 7. | හිස් ලයිසෝල් පීප්ප (හතරැස්) ... | 150 |

2. ඉහත සඳහන් හිස් භාජන බොරැල්ල ප්‍රැන්සිස් පාරේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේදී සෙනසුරාදා හා ඉරිදා දිනයන් හැර සතියේ වැඩ කරන දිනයන්හි පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා පරීක්ෂාකර බැලීමට පුළුවන.

3. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබන කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම්පස උඩ කෙළවරේ "හිස් භාජන විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. මරදාන ඩීන්ස් පාරේ අංක 355 දරන ස්ථානයේ රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩරයට අමුනා එවිය යුතු ය.

5. ටෙන්ඩර් පත්‍ර ඉහත සඳහන් පළමු ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

6. කිසිම ප්‍රයෝජනයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ල හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාර ගැනීමේ හෝ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක්ම නොපිළිපැද තිබුණොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

7. තෝරානු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුළත දී එම විෂයය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිල ගණන් සම්පූර්ණයෙන්ම රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුළතදී මේ විෂය භාර ගෙන රජයේ බෙහෙත් ගබඩා භූමියෙන් ඉවත් කර ගත යුතුය.

8. ඉහත සඳහන් 7 වන ඡේදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

9. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මරදාන, ඩීන්ස් පාරේ අංක 355 දරණ ස්ථානයේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරිගෙන් ලබා ගත හැක

ඩී. ඒ. ඒ. මුණසිංහ,
ර. බෙ. ග. අධිකාරි.

1973.03.27 දින,
කොළඹ, රජයේ බෙහෙත් ගබඩා අධිකාරි කාර්යාලයේදීය.

4-111—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස්සී 2/3/73

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**ගෝස් ඇබසෝබන්ට් යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගෝස් ඇබසෝබන්ට් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 10, තැ.පෙ. 584, 385 ඩීන්ස් පාර අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.04.24 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ (iv) වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10 ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

කොළඹ, 1973.03.26.

ආර්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

අදල උපලේඛනය

SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Gauze Absorbent B.P.C. Quality 36″ wide<br>*B.P.C. Threads per inch :*<br>Warp average not less than 19 ; Weft—average not less than 15 ; Weight—not less than 180 grains per square yard | 2,000,000 yards | In 100 yards rolls and 40 rolls to a bale |
| 2 .. | Sanitary Towels with loops large size for maternity work Size—length 8″ ; width 3″ ; Thickness ½″ Average weight per pad—Not less than 200 grains<br>*Absorbency*—1G compressed to a volume of about 20 ml. placed lightly by means of a forcep on the surface of water at 20°C becomes saturated within 10 seconds. This refers to the material used for making pads. The pads should be made of full cellulose wadding with an outer covering of gauze or full cotton wool with an outer covering of gauze or half cellulose wadding and half cotton wools with an outer covering of gauze | 16,000 gross | In packets of 144 and 20 gross to a bale |
| 3 .. | Wadding Cellulose B.P.C. .. | 130,000 lbs | In 1 lb (nett) rolls and 100 lbs to a bale |

4-85—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ටෙන්ඩර් ඇප රු. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාලු | මස් | කරවල | එළ වළු | බිත්තර | රෝගීන්ට: මාලු | මස් | කරවල | එළ වළු | බිත්තර | ටෙන්ඩර් කළ යුතුව ඇති කාලය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. සඳලංකාව මා.නි. ... | 100 | 500 | 1973 | 100 | 100 | 100 | 500 | 100 | 100 | 100 | 100 | 200 | 100 | 1973 මැයි මස 1 |
| 2. මොහොත්තුවාගොඩ මා.නි. | 100 | 500 | අප්‍රේල් මස | 100 | 100 | 100 | 500 | 100 | 100 | 100 | 100 | 600 | 100 | දින සිට 1973 |
| 3. කොබෙයිගනේ මා.නි. ... | 100 | 500 | 24 දිනැළදේ | 200 | 200 | 200 | 750 | 200 | 300 | 300 | 300 | 1,000 | 300 | දෙසැම්බර් 31 |
| 4. පහල ගිරිබාව ග්‍රා.රෝ. ... | 100 | 800 | 10.00 ට | 300 | 500 | 500 | 1,000 | 500 | 1,500 | 1,500 | 1,500 | 5,000 | 1,500 | දක්වා |

04–13—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

පාවිච්චි කරනලද පිරවිය හැකි ටයර විකිණීම

බොරලැස් ගමුවේ, වේරහැර අපහරණ අංගනයේ තිබෙන පාවිච්චි කරන ලද නැවත පිරවිය හැකි ටයර 12,000 ක් පමණ මිළදී ගැනීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර්, කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973. 05. 08 දින පෙරවරු 10. 00 දක්වා භාරගනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තුව වශයෙන් රු. 10 ක් සමග අඩු වශයෙන් රු. 100 ක් හෝ උපරිම වශයෙන් රු. 5,000 ක් ගෙවා 73. 05. 07 දින පස්වරු 3. 00 දක්වා නියමිත ටෙන්ඩර් පෝර්මයන් මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

මෙම ටයර සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළ පරීක්ෂා කළ හැකිය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර, බොරලැස් ගමුව.

04–132—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

ගැලුම් 45/46 ප්‍රමාණයේ පීප්ප විකිණීම

දිවයිනේ සියළුම ඩිපෝවන්හි එකතුවන ගැලුම් 45/46 ප්‍රමාණයේ හිස් පීප්ප සහ දැවුණු තෙල් සහිත පීප්ප මිළදී ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් කොළඹ 5, කිරුළ පාරේ 200, දරණ ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.05.03 දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පත් ගාස්තුව වන රු. 10 සමග ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 2,000 ක් ගෙවා, 1973.05.02 දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් පෝරම මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර, බොරලැස් ගමුව.

04–134—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### පෙරෝ සිලිකන්, ඩලිකන් කාබයිඩ්, පෙරෝ මැන්ගනීස්, කැල්සියම් කාබයිඩ්, රමින් මිශ්‍රණ සෝඩියම් කාබනේට්, සිරියල් බයින්ඩර්, ලින්සීඩ් ඔයිල් සහ සෝඩියම් සිලිකේට් සැපයීම

1973 මැයි මස 21 දින පෙරවරු 10 දක්වා ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. රු. 100 ක් ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 10ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිළට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර, කොළඹ 5.

04–78—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### සමූපකාර තොග වෙළඳ සංස්ථාව

වැලිසර සතොස ගබඩා සමූහයට වතුර සැපයීම සඳහා වතුර ගැලුම් 15,000 ක් අල්ලන ටවර් එකක්ද, ගැලුම් 15,000 ක් වතුර සපයන පම්පයක්ද, ගැලුම් 5,000 ක් වතුර සපයන වතුර පම්පයක්ද, වතුර සැපයීම සඳහා බෙදා හරින පයිප්ප සහ අනිකුත් උපකරණ ද මෙම ගබඩා සමූහයට පිවිසෙන මාර්ග අළුත්වැඩියා කිරීමටද සීල් කරන ලද ටෙන්ඩර් සමූපකාර තොග වෙළඳ ආයතනයේ සාමාන්‍යාධිකාරී (පාලන) විසින් භාරගනු ලැබේ.

'පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත් කළමනාකරු, උපදේශක කණ්ඩායම, ශ්‍රී ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව, 120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 වෙතින්, 1973 අප්‍රේල් මස 9 වෙනි සඳුදා සිට 1973 අප්‍රේල් මස 25 වෙනි බදාදා ආපසු ලබාගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් සහ ආපසු නොගෙවනු ලබන, වැඩිපුර රු. 50 ක් තැන්පත් කොට ලබාගත හැක. වැඩිපුර සෑම පිටපතක් සඳහා ආපසු නොගෙවන රු. 25 ක මුදලක් අයකරනු ලැබේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සාමාන්‍යාධිකාරී (පාලන) කාර්යාලයේ ටෙන්ඩර් තැන්පත් භාර ගැනීම 1973 මැයි මස 7 වෙනි සඳුදා පෙරවරු 10. 00 ට නතර කරනු ඇත.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක වතුර සැපයීම සහ ජලප්‍රවාහන ක්‍රම සම්බන්ධව ලියාපදිංචි කරන ලද ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් සීමාවන අතර, රු. 3,00,000 ක වටිනාකමක් ඇති වැඩ සඳහා ලියාපදිංචි වී තිබිය යුතුය.

වැඩිපුර විස්තර සඳහා කළමණාකරු, උපදේශක කණ්ඩායම, ශ්‍රී ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව වෙතින් විමසන්න.

සාමාන්‍යාධිකාරී (පාලන),
සතොස.

සාමාන්‍යාධිකාරි (පාලන) කාර්යාලය,
සමූපකාර තොග වෙළඳ සංස්ථාව,
තැ. පෙ. අංක 990,
440, යූනියන් පෙදෙස,
කොළඹ 2, 1973. 03. 24.

04–133—73.04.6 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

## රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### පාවිච්චි කරන ලද ටයර් සහ ටියුබ් තොගයක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් පාවිච්චි කරන ලද ටයර් සහ ටියුබ් තොගයක් විකිණීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් 1973 අප්‍රේල් 27 වැනි දින පෙරවරු 10.00 ට පෙර ලැබෙන සේ එවිය යුතු අතර, තැපැලෙන් නො එවන ටෙන්ඩර් මෙම අමාත්‍යාංශ කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම ද කළ හැකිය.

#### ටයර් සහ ටියුබ් සම්බන්ධ විස්තර

| ටයර් වල ප්‍රමාණය | | ටියුබ් |
|---|---|---|
| 700 × 14 | 8 | 49 |
| 650 × 13 | 9 | |
| 640 × 13 | 26 | |
| 750 × 14 | 2 | |
| 695/645 × 14 | 2 | |
| 165 × 15 | 5 | |
| 600 × 16 | 27 | |
| 560 × 15 | 13 | |
| 560 × 14 | 2 | |
| 590 × 14 | 4 | |
| 640 × 15 | 6 | |
| 155 × 12 | 3 | |
| 550 × 12 | 2 | |
| 600 × 12 | 2 | |
| මෝටර් බයිසිකල් ටයර් | 4 | 01 |

2. මෙම අමාත්‍යාංශ කාර්යාලයේ දී සතියේ දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 3.30 දක්වා ටයර් තොගය පරීක්ෂා කර බැලිය හැකිය.

3. තමන් විසින් පිළියෙල කරගත් ෆෝර්ම කොළයක සකස් කළ යුතු ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව "පාවිච්චි කරන ලද ටයර් සහ ටියුබ් තොගයක් මිළයට ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ ලියුම් කවරයක බහා, සීල් තබා එවිය යුතු වේ. මෙම අමාත්‍යාංශ කාර්යාලයට රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද ටෙන්ඩරයට අමුණා එවිය යුතු වේ.

4. කිසිම හේතුවක් නොදක්වා කවර ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුව ඇති බව ද නිවේදනයෙහි එන සියළුම කොන්දේසිවලට එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් භාර නො ගන්නා බව ද සැළකිය යුතු වේ.

5. තමන් විසින් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් ඉවත් කර ගැනීමට ටෙන්ඩර් ඉදිරිපත් කළ කවරෙකුට හෝ අවසර දෙනු නො ලැබේ.

6. මෙහිලා පිළිගැණුනු ටෙන්ඩරය එවූ තැනැත්තා විසින් ටයර් සහ ටියුබ් තොගය සඳහා ගෙවීමට කැමැති වුනු මිළ, ටෙන්ඩරය පිළිගැණුනු බව නිවේදනය වී දින හතක් ඉක්මවීමට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට සම්පූර්ණයෙන්ම ගෙවා දින හතක් ඇතුලත ඔහු විසින් ම ටයර් තොගය ඉවත් කර ගත යුතුයි.

7. ඉහත දැක්වූ 6 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට එකඟව ක්‍රියා නො කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර එම කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුගේ නම රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

8. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර එවූ සියළු දෙනාටම පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේ 1973 අප්‍රේල් 27 වැනි දින පෙරවරු 10.00 ට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තැනගේ කාර්යාලයේ දී ය.

9. ටයර් සහ ටියුබ් තොගය ඉවත් කර ගැනීමේ දී වැය වන මුළු වියදම සාර්ථක ටෙන්ඩර්කරු විසින්ම දැරිය යුතුයි.

බී. මහාදේව,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ සවදේශ
කටයුතු අමාත්‍යාංශය.

1973 මාර්තු 26 දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ දී ය.

40-82—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වැඩට ගත නොහැකි මෝටර් වාහන විකිණීම

මෙහි පහත දැක්වෙන මෝටර් වාහන විකිණීම පිණිස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් 1973 මැයි 4 දා පෙරවරු 9.30 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් භාරගනු ඇත.

| ලියා පදිංචි අංකය | | වර්ගය | | සඳහන් කළයුතු අඩුම මිල රු. | ශ. |
|---|---|---|---|---|---|
| (1) සී.වී. 3386 | ... | විලිස් සුපර් ජීප් | ... | 2,000 | 0 |
| (2) 33 ශ්‍රී 1771 | ... | එම | ... | 2,000 | 0 |
| (3) සී.වී. 2721 | ... | ෆෝඩ්සන් ලොරිය | ... | 4,000 | 0 |
| (4) සී.එන්.1156 | ... | ඔස්ටින් ගිලන් රථය | ... | 1,000 | 0 |
| (5) ඊඑන් 2328 | ... | විලීස් ජීප් | ... | 3,500 | 0 |
| (6) 4 ශ්‍රී 7701 | ... | ඒ 60 කන්ට්‍රිමන් | ... | 9,860 | 0 |

කොළඹ 5, නාරාහේන්පිට, මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරි සමග කලින් දිනයක් නියම කර ගැණීමෙන් මේ වාහන කාර්යාල වේලාව තුල පරීක්ෂා කර බැලිය හැකි වේ. 4 ශ්‍රී 7701 දරණ වාහනය කොළඹ 10, ද සේරම් පෙදෙස, විදුලි වෛද්‍ය ඉංජිනේරු කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ (කොළඹ කච්චේරිය හැර) වෙනත් කච්චේරියක හෝ කොළඹ යෝක් විදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමට රු. 100 ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973 අප්‍රේල් මස 25 වනදා පස්වරු 2.00 දක්වා, කොළඹ 10, ඩීන්ස් පාරේ, ජාතික ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර ගොඩනැගිල්ලේ දෙවෙනි මහලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ ගිණුම් අංශයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පිටපත් දෙකකිනි. එක් එක් වාහනය අරබයා වෙන වෙනම මිළ ගණන් දැක්විය යුතුය.

3. ටෙන්ඩර් බහා එවන හැම කවරයකම වම් පැත්තේ උඩු කෙලවරේ "වැඩට ගත නොහැකි වාහන මිලේට ගැණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් හනක් තබා එය කොළඹ 10, ඩීන්ස් පාරේ, ජාතික ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර ගොඩනැගිල්ලේ තැ. පෙ. අංක 584 හිමි (ගිණුම්) සෞඛ්‍ය සේ. අධ්‍යක්ෂට පිට නම ලියා එවිය යුතුයි. ටැන්ඩර් කරුගේ නම සහ ලිපිනයද කවරයේ වම් පැත්තේ යට කොටසේ දැක්විය යුතුයි. ටැන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් හෝ එවිය යුතුයි. නැත්නම් කොළඹ 10, ඩීන්ස් පාරේ ජාතික ක්ෂය රෝග මර්ධන ගොඩනැගිල්ලේ දෙවෙනි මහලේ ප්‍රධාන ගණකාධිකාරි කාර්ලයේ ඒ සඳහා තබා ඇති ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයි.

4. මෙහි 1 වන ඡේදයේ සඳහන් දිනයේ එකී වේලාවෙන් ඉක්බිති ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටැන්ඩර් කවර කඩා බලන විට ටැන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැකි වේ. ටැන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුනොවුන් විසින් සඳහන් කරන්නට යෙදුණු මිළ ගණන් ඒ වේලාවේද කියවනු ඇත.

5. ටැන්ඩරය බාරගත් බව දැනුම් දී 3 දිනක් ඇතුලත එහි මුළු වටිනාකම ගෙවා වාහනය ගෙන යාමට ජයගත් ටැන්ඩර් කරු අපොහොසත් වෙතොත්, කිසිදු අයිතිවාසිකමකට ඉඩ නොතබා තැන්පත් මුදල රාජසන්තක කරනු ඇත.

6. තමන්ගේ ටැන්ඩරය පිළිගත් බවට ලියා දෙන දැන්වීමක් ලැබී හත් දිනක් ඇතුලත තමන් ටැන්ඩර් කළ මිළ මුළුමනින් ගෙවා දැමීමට යම් ටැන්ඩර් කරුවකු නොකැමති වෙතොත් හෝ, අපොහොසත් වෙතොත් හෝ ඔහු තැන්පත් කළ මුදල රාජසන්තක කොට, ඊළඟට ඇති ඉහළම ගණන සඳහන් කළ ටැන්ඩර්කරුට වාහනය දෙන අතර, රජයේ කටයුතු පැහැර හරින ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට මුලින් කී අයගේ නම ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

7. 1973. 4. 25 දා පස්වරු 2.00 තෙක් ටෙන්ඩර් කොළ නිකුත් කරනු ඇත.

8. 1973 මැයි 4 පෙරවරු 10. ට කොළඹ 10, ඩීන්ස් පාරේ පිහිටි (ගිණුම්) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රධාන ගණකාධිකාරී කාමරයේදී ටැන්ඩර් විවෘත කරනු ඇත. ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයින්ට හෝ කැමති නම් එහි පෙනී සිටීමට අවසර ඇත.

9. තමන් ඉදිරිපත් කරන ටැන්ඩර් මිල ගණන ටැන්ඩර් පියවූ දිනයේ සිට සති 4 ක කාලයකට වලංගු වනසේ තබා ගනු ඇතැයි ටැන්ඩර්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

10. ටැන්ඩර් කරන ගණන ඉලක්කමෙනුත් නැවත අකුරෙනුත් ටැන්ඩර් කොලයේ ලියා තිබිය යුතුයි. වචන සහ/නොහොත් ඉලක්කම් අතරේ යම් පරස්පරයක් දක්නට ලැබුණොත් ටැන්ඩරය පිටු දකිනු ලැබීමට යටත් වේ. ටැන්ඩර්පතේ කරනු ලබන වෙනස් කිරීම් සහ මකා හැරීම් සියල්ලම ටැන්ඩර්කරුගේ කෙටිසන යෙදිය යුතුයි.

11 මෙහි 5 වන ඡේදයේ කොන්දේසියට යටත්ව ටැන්ඩර් පත් මුදල ආපසු ගෙවනු ඇත.

12. මේ පිළිබඳ වැඩි දුරටත් විස්තර වුවමනා වෙතොත් කොළඹ මහ ලේකම් පායේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිල ධාරියාගෙන් විමසා දැන ගත හැකි වේ.

13. ටැන්ඩර් පත් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ පිළිගැනීමට නැත්නම් පිටු දැකීමට ඇති අයිතිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සතුවේ.

එන්. මහේසන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 මාර්තු 28 දා කොළඹ,
සෞ. සේ. අ. කාර්යාලයේ දී ය.

4–83—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### අනුරාධපුරය, මහනුවර හා රත්නපුරය ප්‍රාදේශවලින් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දැව සැපයීම සඳහා කොළඹ 5, වජිර පටුමග අංක 7 දරණ ස්ථානයේ, රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ :

(i) රු. 1,00,000 හා ඊට වැඩි වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා ලියා පදිංචි වූ 1 පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 1,00,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ii) රු. 50,000 වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා ලියා පදිංචි වූ 1 හා 2 පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 50,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

3. පහත දැක්වෙන එක් එක් ප්‍රදේශයෙන් රු. 50,000 වටිනාකමට කඳන් හා සිල්පර සැපයීම සඳහා ටෙන්ඩර්.

(1) අනුරාධපුර ප්‍රදේශය.

(අ) ආනාඋලුන් දාව අංක 1.
(ආ) මහවැලිගඟ උතුරු රක්ෂිතය.
(ඇ) මහවැලිගඟ දකුණු රක්ෂිතය.
(ඈ) ඇතාකඩ.
(ඉ) පෙරියකුලම් වැව.
(ඊ) නිකවැව.
(උ) මිල්ලගොල්ල වැඩබිම.

4. රු. 1,00,000 ක වටිනාකමට කඳන් හා සිල්පර සැපයීම සඳහා ටෙන්ඩර්.

(1) අනුරාධපුර ප්‍රදේශය.

(අ) පංකුලම් අංක III.

5. පහත දැක්වෙන එක් එක් ප්‍රදේශයෙන් රු. 2,50,000 ක වටිනාකමට කඳන්, සිල්පර හා ඉරු ලී සැපයීම සඳහා ටෙන්ඩර්.

(1) මහනුවර ප්‍රදේශය.

(අ) වැළඩකන්ද යෝජිත රක්ෂිතය.

(2) රත්නපුර ප්‍රදේශය.

(අ) කෝප්පකන්ද ර. අ. කැ.

(3) අනුරාධපුර ප්‍රදේශය.

(අ) මල්වතුඔය කැලය.

6. 1973.04.23 දින අ. භා. 2.00 දක්වා ටෙන්ඩර් අකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

7. 1973.04.24 දින පූ. භා. 11.00 ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරනු ඇත.

8. වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකාරවරුන්ගෙන් හෝ කොළඹ 5, වජිර පටුමග අංක 7 දරණ ස්ථානයේ, ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබා ගත හැකිය.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී අංශය, 7, වජිර පටුමග, කොළඹ 5.

4–77—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවාව—ජාඇල–කැළණිය කොට්ඨාශය

ජාඇල–කැළණිය කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1973.04.26 දින පෙ.ව. 11.00 දක්වා කොනිස්ටන් පෙදෙසේ කොළඹ 7 බටහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂතුමා විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලාවේම සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, සමුපකාර සමිතිවල ග්‍රාම සංවර්ධන සමිතිවලට හා රජයේ අනිකුත් සංස්ථාවල ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් කළ හැක.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වූ ගණන රු. ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|
| කැළණිය සැළසුම් යෝජනා ක්‍රමය, හුදර්ශන සහ මතුපිට කානු ක්‍රමය, බොරළු පස් සැපයීම | 1,00,000 0 | ... | 100 0 |

1973.4.19 වෙනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ටොරින්ටන් චතුරශ්‍රයේ කොළඹ 7, ජාඇල–කැළණිය කොට්ඨාශයේ විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝරම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා විධායක ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝරම නිකුත් කිරීමට පෙර එම වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල විධායක ඉංජිනේරු තැනගේ කාර්යාලයේ තැන්පත් කොට හෝ කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් 1973.4.19 වෙනි දින හෝ ඊට පෙර කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

මෙම වැඩය ගැන සියළුම විස්තර හා සැළසුම් ආදිය කාර්යාලීය වේලාවන් තුළදී ටොරින්ටන් චතුරශ්‍රයේ කොළඹ 7, ජාඇල–කැළණිය කොට්ඨාශයේ විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

සී. ආර්. තිසේනායගම්,
වැඩ අධ්‍යක්ෂ,
බටහිර දිසාව.

කොළඹ 7, කොනිස්ටන් පෙදෙසේ,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

4–44—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම්

### රේගු වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1973 අප්‍රේල් මස 24 වැනි දින පෙ. ව. 9.30 ට ඒප් 2 විකුණුම් ගුදමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ඒවා 1973 අප්‍රේල් 23 වැනි දින පෙ. ව. 10 සිට ප. ව. 2 දක්වා පරීක්ෂා කළ හැකිය.

සාර්ථක ලංසුව තබන්නා විසින් වැඩිම ලංසුවෙන් 50% ක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය.

වෙන්දේසියට අදාල වෙනත් කොන්දේසි 1954.05.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවේ.

ඩී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1973.03.15 වැනි දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගුවේදීය.
මගේ අංකය : නි. අ./විකිණීම්. 13/73.

1. ලාම්පු පාත්තිර රෝල් 71 ක්,
කඩල පරිප්පු රාත්තල් 4 ක්,
මයිසූර් පරිප්පු රා. 10 ක්,
මුං ඇට රා. 4 ක්,
මිරිස් කුඩු රා. 4 ක්,
අත් බොත්තම් ජෝඩු 10 ක්,
2. තුං මං ත්‍රිත්ව විදුලි කීලකයන් 71 ක්,
3. ෂාප්ට් 3 ක්,
4. ලක්ස් සබන් (ඉංග්‍රීසි) කෑබැලි 6 ක්,
5. පොල් තෙල් ගැලුම් 1×3 ක්,
"එලයිට්" බාර් සබන් බාර් 32 ක්,
ලක්ස් සබන් කැබලි 48 ක්,
විස්කෝතු ටින් 1 ක්,
6. පලුදු වූ සෙල්ලම් ඔර්ලෝසු 2,600 ක්,
7. "තෙල්ටෙක්ස්" උල්පත් පෑන් දුසිම් 13 ක් සහ පයිලට් අනුකරණ පෑන් දුසිම් 269 ක්,
8. කලු රැන් කැරලි (7×10), පලුදුවූ මිණුම් ටේප් (53×12),
9. පලුදුවූ ජෝති මුතු පොටවල් 12 මිටි (490 ක්),
10. දැති පනා 640 ක්,
11. ජේම්ස් බොන්ඩ් ලාංඡන 200 ක්.
ප්ලාටෝ බෝල් පොයින්ට් කූරු (24×144),
බිත්තර දමන කිකිලියන් (සෙල්ලම් බඩු) 60 ක් තරක් වූ,
12. ඇස් බැම් පාට කරණ පැන්සල් (146×12),
ප්ලාස්ටික් කාඩ් 292 ක් (තෙත්වූ),
13. පලුදුවූ පිත්ත පටි රෝල් 1,000 ක්,
14. කෘතිම ආභරණ (පෙන්ඩන්ට්) 3,600 ක්,
15. වලලු ජෝඩු පෙට්ටි 480 ක්, වලලු ජෝඩු පෙට්ටි 660 ක්, වලලු ජෝඩු පෙට්ටි 912 ක්,
16. පලුදු වූ සෙල්ලම් ඇස් කණ්නාඩි 650 ක්, කෘතිම වෙන් පැකැට් 12 ක්,
17. ප්ලාස්ටික් වළලු ජෝඩු 14,400 ක්,
18. තරක්වූ රිදී කුඩු රා. 35 ක්,
19. "ෆ්ලුර් ඩි කැබක්" සුවඳ ද්‍රව්‍ය කුප්පි 2 ක්, "රිස්ලා" සිගරට් කඩදාසි පකැට් 36 ක්,
20. මහතුන්ගේ නාන ඇඳුම් 1 ක්, නයිලෝන් කමිස 1 ක්,
21. බෙක්ස් බියර් පයින්ට් 4 ක්,
22. "ඉම්පැක්ටා 126" කැමරාවක්,
23. බොබින් සහිත සින්ගර් ෂටිල් 47 ක්,
24. කොම්ප්ලනින් පෙති 30 බෝතල් 9 ක්,
25. ප්ලාස්ටික් ෂටිල් කොක්ස් 99 ක්, ෆේදර් ෂටිල් කොක්ස් 30 ක්, ප්‍රමාණය අංක 5 බිලැඩරයක්, ප්ලාස්ටික් වලලු ජෝඩු 8,500 ක්,
26. පාට වෙනස් වූ සිල්ක් සාරි 4 ක්,
27. තාලි සවුඩු 6 ක්, පිත්ත පටි රෝල් 4 ක්, රැන් කැරලි 10 ක් (එකක් ග්‍රෑම්ස් 50 ක්),
මැක්ස් නිය පොලිෂ් බෝතල් 3 ක්, මහතුන්ගේ ලේන්සු 2 ක්, කාන්තා ලේන්සු 1 ක්,
පබලු මිටි 7 ක්, මුදු 3 ක්, කෘතිම මල පැකට් 2 ක්, විදුලි කම්බි රෝල් 1 ක්,
'ගෝ-ගෝ' කොන්ඩා දල් (2×12), වලලු ජෝඩු පෙට්ටි 6 ක් කර්ණාභරණ ජෝඩු 48 ක්,
අනුකරණ මුදු 3 ක්, අනුකරන පයිලට් පෑන් 2 ක්, අනුකරණ පාකර් පෑන් 1 ක්, ක්‍රෙස්ට් පෑන් 3 ක්,
28. (කිලිටි වූ) නයිලෙක්ස් සාරි 1 ක්,
29. 'ගෝ-ගෝ' කොණ්ඩා දැල් (300×12),
30. නයිලෝන් ඔරලෝසු පටි 940 ක්,
31. වානේ ඔරලෝසු පටි 64 ක්,
32. එකක් මීටර් 9 අංක 2 ප්ලාස්ටික් පැකට් 25×12,
එකක් මීටර් 9 අංක 3 ප්ලාස්ටික් පැකට් 46×12,
එකක් මීටර් 9 අංක 4 ප්ලාස්ටික් පැකට් 51×12,
එකක් මීටර් 9 අංක 5 ප්ලාස්ටික් පැකට් 25×12,
එකක් මීටර් 9 අංක 6 ප්ලාස්ටික් පැකට් 5×12,
33. යතුරු මුදු 6,400 ක්,
34. 'රොස්මේරි' කොණ්ඩා කටු කාඩ් 1,868×24,
'ටෝපිඩෝ' කොණ්ඩා කටු කාඩ් 1310×36,
'ටෝපිඩෝ' කොණ්ඩා කටු කාඩ් 1,310×36,
35. වික්ටර් ඉබි යතුරු දුසිම් 187 ක්,
ටයිගර් ඉබි යතුරු දුසිම් 120 ක්, කණ්නාඩි කුට්ටම් (කියවන) 48 ක්,
36. තඹ කල 1 ක්,
ඇලුමිනියම් කල 2 ක්,
ඇලුමිනියම් තැටි 4ක්,
ගැල්වනයිස් බකට් 1ක්,
කෑලි 3 වින්චෙස්ටර් ටෝච් 1 ක්, } පාවිච්චි කළ.
37. කැලි දෙකකින් යුක් ඉංග්‍රීසි බ්ලේසර් රෙදියාර 13 ක්,
38. ප්ලාස්ටික් වලලු ජෝඩු 22,560 ක්,
39. සිත්බෙක්ස් නයිලෝන් ඔර්ලෝසු පටි පෙට්ටි 13×72,
සිත්බෙක්ස් නයිලෝන් ඔර්ලෝසු පටි පෙට්ටි 1×60,
40. 3¾" ලේස් රෝල් 251, 2¼" ලේස් රෝල් 86 ක්, 3" ලේස් රෝල් 130 ක්,
41 කඩදාසි දින දර්ශන 489,
42. නෝනා මහතුන්ගේ දැති පනා 1305, මහතුන්ගේ පනා 24 ක්,
43. "ටයිගර් 333" ඉබි යතුරු 149, "ටයිගර් 222" ඉබි යතුරු 189, "ටයිගර් කබ්" ඉබි යතුරු 3,312 ක්,
44. ලාම්පු උඩ කොටස් 544, ලාම්පු උඩ කොටස් 647,
45. රතිඤ්ඤා මිටි 1 ක්, බුලට්' රතිඤ්ඤා පැකට් 1 ක්, පැරචුට් 1ක්, චුම්බක පත්දම් පැකට් 1 ක්, ගිණි කෙලි කෑලි 7 ක්,
46. සෙලෝපේන් පැකට්වල අඩංගු බ්‍රෝච් (බොරු රන් රිදී බඩු) 168 ක්,
සම්පූර්ණ ආභරණ සෙට් 42 ක් (බොරු රන් රිදී බඩු),
මාල 6 ක්, බ්‍රෝච් 5 ක්,
47. පාවිච්චි කළ ජර්කින් 1 ක්,
48. නැෂනල් සන්යෝ ලාම්පු (සයිකල් ඩයිනමෝ) 3ක්,
49. 7209-බෝල් රේසර්—එස්. කේ. එෆ්—සෙට් 4 ක්,
6310-බෝල් රේසර්—එස්. කේ. එෆ්—සෙට් 1 ක්,
50. 55-ආර්විඩ. 3—රෝල් රේස් 1 ක්,
51. සිගරට් කඩදාසි පැකට් 99 ක්,
52. එස්. කේ. එෆ්. බෝල් රේසර් 6 ක්,
53. රාත්‍රී ලම්පු 1 ක්,
54. සිගරට් කඩදාසි පැකට් 18 ක්,
55. බැලන්ටින් බිරවින් 2 ක්, ගිණිකූරු පෙට්ටි 2 ක්,
56. අත් බොත්තම් ජෝඩු 3 ක්,
57. අනුකරන මුදු 1,030 ක්,
58. ඇස් බැම් පාට පැන්සල් 48 ක්, 'ෂේප්ට්' රේසර් 70 ක්,
59. හිස් පයින්ට් බෝතල් 305 ක්, හිස් පයින්ට් බෝතල් 29 ක්,
60. බීර බෝතල් 1 ක්,
61. හිස් බෝතල් පෙට්ටි 5 ක්, හිස් ගෝනි මිටි 2 ක්,
62. කමිස රෙදි යාර 3 ක කෑලි 1 ක් (පලුදු වී ගිය)
කමිස රෙදි යාර 2 1/2 ක කෑලි 1 ක් (පලුදු වී ගිය)
කමිස රෙදි යාර 27 ක කෑලි 2 ක් (පලුදු වී ගිය)
63. කාබයිට් පීප්ප 1 ක්,
64. රුවල සහිත රුවල් බෝට්ටු 1 ක් (ඊ. ඊ. එන්. 149),
65. ජේ. 29—පදින ඔරු 1 ක්,
66. පදින ඔරු 1 ක් (හබල් 2 ක් සහිත).
67. පාවිච්චි කල තුවා 1 ක්, පාවිච්චි කළ දුඹුරු පාට කමිස 1ක්, කොලපාට ඉරි සහිත කමිස 1 ක්, විවෘත කල, 'ඔමෝ' පැකට් 1 ක්, ගිණි පෙට්ටි 20 ක්, ලී පෙට්ටියක අසුරා ඇති සන්ලයිට් සබන් කැබලි
68. පැට්‍රොමැක්ස් ලාම්පු 2 ක් (අසම්පූර්ණ),
69. කුකුල් කෑම පීප්ප 2 ක්, කුකුල් කෑම බෑග් 1 ක්,
70. වානේ අත් ඔර්ලෝසු පටි 251 ක්,
71. අත් ඔර්ලෝසු පටි 60 ක්,
72. පාවිච්චි කළ කලිසම් 2 ක්,
ජර්සි 1 ක් (පාවිච්චි කළ),
73. පයිප්ප බට හා සිස්ටම් 1 ක්,
74. බාබර් දැලි පිහි 475 ක්,
කුඩා කොණ්ඩා කැරසිලි 66 ක්.

4-138—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

### රේගු වෙන්දේසිය

වවුනියා කච්චේරියේ තිබෙන, පහත සඳහන් භාණ්ඩ 1973 අප්‍රියෙල් මස 24 වැනි දින, පෙ. ව. 9.00 ට ආරම්භව, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගැණුම්කරුවන්ට, මෙම භාණ්ඩ 1973 අප්‍රියෙල් මස 23 වැනි සඳු දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 11.30 දක්වා පරීක්ෂා කිරීමට පිළිවන.

භාණ්ඩ තීන්දු කල වහාම මුදල් ගෙවා ඉල්ලුම්කරුවන් විසින් ඒවා ඒ අවස්ථාවේදීම ඉවත් කර ගත යුතුය.

වෙන්දේසිය පැවැත්වෙන්නේ, 1954 මැයි 28 වැනි දින පළවූ ගැසට් පත්‍රයෙහි සඳහන් කොන්දේසිවලට අනුකූලවය.

එල්. පී. වික්‍රමාරච්චි,
රේගු අයකැමි,
වවුනියා දිස්ත්‍රික්කය.

1973 මාර්තු මස 26 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දීය.

| | | |
|---|---|---|
| 1. ඇස් බැමි පාට කරන පැන්සල් | — | දුසිම් 102 යි. |
| 2. කෘතිම මුතුමාල සහ මුතුවැල් | — | 19,762 යි. |
| 3. රේන්ද පටි (සුදු සහ කළු) රෝල් | — | 1726 යි. |
| 4. පනා | — | 4750 යි. |
| 5. ඔරලෝසු පටි | — | 2989 යි. |
| 6. උල්පත් පෑන් (පාකර්, ක්‍රොස්ව්) නෝව්, ස්වෝන් ආදිය) | — | 29,729 යි. |
| 7. ප්ලාස්ටික් වළලු | — | 47,616 යි. |
| 8. තොල් සායම් කූරු | — | 384 යි. |
| 9. හිස් ආවරණ සාටක | — | 1,137 යි. |
| 10. සායා වාටි | — | 191 යි. |
| 11. මැන්ටල් (එමරල්ඩ්) ග්‍රෝස් | — | 153 යි. |

(ඉහත සඳහන් කර ඇති ප්‍රමාණය දළ වශයෙනි.)

4–129—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### යුද හමුද මූලස්ථානය

#### පරිහරණයට නුසුදුසු රථවාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පරිහරණයට නුසුදුසු පහත දක්වෙන රථවාහන හෝමාගම, පනාගොඩ, පිහිටි යුධෝපකරණ ගබඩාවේදී 1973 අප්‍රේල් මස 25 වෙනි බදද පෙ.ව. 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | ගණන |
|---|---|---|
| (1) ෆෝර්ඩ් කස්ටම් ලයින් කාර් | ... | 2 |
| (2) බියුක් ස්පෙෂල් කාර් | ... | 1 |
| (3) ධාවන පාපැදි බී.එස්.ඒ. | ... | 1 |
| (4) විලිස් ජීප් ... | ... | 18 (2 සුන්බුන් වශයෙන්) |
| (5) විලිස් බීප් ... | ... | 7 |
| (6) තේම්ස් ට්‍රේඩර් ටොන් 3 ට්‍රක් රථ | ... | 5 |
| (7) ෆෝර්ඩ්සන් තේම්ස් ටොන් 3 ට්‍රක් රථ | | 7 |
| (8) බෙඩ්ෆෝර්ඩ් ටිපර් ටොන් 5 | ... | 1 |
| (9) ෆෝර්ඩ් තේම්ස් (ගිලන් රථ) | ... | 2 |
| (10) ඔස්ටින් ගිලන් රථ | ... | 1 |
| (11) ෆෝර්ඩ් තේම්ස් වතුර බෞසරය (ටැංකිය රහිත) | ... | 1 |
| (12) ඩොජ් පවර් වැගන් | ... | 1 |

රථවාහන ගැනුම්කරුවන් විසින් ඉල්ලුම් කර මිළයට ගන්නා වාහන සඳහා මුදල් සම්පූර්ණයෙන් ගෙවා එදිනම පස්වරු 3.30ට පෙර ඉහත කී ගබඩා පෙදෙසින් ඉවත් කරගත යුතුවේ. චෙක්පත් භාරගනු නොලැබේ.

මෙම වාහන 1973 අප්‍රේල් මස 24 වෙනි දින පෙ.ව. 10.00 පැයේ සිට 3.30 පැය දක්වා කාලය තුල පහත සඳහන් ස්ථානයේදී පරීක්ෂා කළ හැක.

යුධෝපකරණ ගබඩාව,
හමුද ජනපදය,
පනාගොඩ, හෝමාගම.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුද ආඥපති වෙනුවට.

යුද හමුද මූලස්ථානය,
තැ.පෙ. 553,
කොළඹ,
1973 මාර්තු මස 27 දින.

3–102—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### කණුවන මහෙස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකර ලද පහත සඳහන් භාණ්ඩ කල්වේලා ඇතිව අයිතිවාසිකම් ඉදිරිපත් කර, එම භාණ්ඩ ලබා නොගතහොත් එම භාණ්ඩ 1973 අප්‍රියෙල් මස 11 වැනි දින ප.ව. 1.00 ට කණුවන මහෙස්ත්‍රාත් උසාවි භූමියේදී ප්‍රසිඩ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වමි.

වෙන්දේසියේ සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් මිළදී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම නියමිත මුදල් ගෙවා එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කළ යුතුය.

ස. සේමසිංහ,
කණුවන මහෙස්ත්‍රාත්.

1973 මාර්තු මස 22 වැනි දින,
කණුවන මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

#### පාපැදි

| නඩු අංකය | | පාපැදි අංකය |
|---|---|---|
| 16/70 | ... | ඩී.ජේ. 16216 |
| 2414/69 | ... | ඒ.ඉසෙඩ්. 47929 |
| 2344/69 | ... | ඒ.ඊ. 79450 |
| 2553/70 | ... | බී.ඩී. 97341 |
| 2603/70 | ... | — 401167 |
| 2667/70 | ... | කේ. 18327 |
| 2419/70 | ... | — 3785 |
| 2723/70 | ... | එෆ්.එෆ්. 53696 |
| 2727/70 | ... | එක්ස්. 91395 |
| 2202/69 | ... | වී.ආර්. 52565 |
| 2418/70 | ... | සී.ජේ. 84762 |
| 2581/70 | ... | ඩී.බී. 9162 |
| 2162/70 | ... | සී.එෆ්. 403 |
| 2160/70 | ... | ජී. 0103 |
| 2163/70 | ... | බී.එෆ්. 17953 |
| 78/70 | ... | සී.බී. 81699 |
| 2166/70 | ... | අංකය පැහැදිලි නැත |

#### වෙනත් භාණ්ඩ

| | | |
|---|---|---|
| 24069 | ... | දත්බෙත් විදුළි එකයි |
| 25556 | ... | ග්‍රයිප් වතුර බෝතල 1යි |
| 25374 | ... | විටාමෝල්ට් ටින් එකයි |
| — | ... | පුනීල හතරයි |
| — | ... | ජෝගු එකයි |
| — | ... | තඹ දරනු කැලි |
| — | ... | මේස ලාම්පු එකයි |
| — | ... | මන්නා පිහි තුනයි |
| — | ... | කැති දෙකයි |
| — | ... | පොල් උල් එකයි |
| — | ... | ප්ලාස්ටික් කෑන් |

4–33—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

### මහනුවර මහෙස්ත්‍රාත් උසාවිය

### වෙන්දේසියේ විකිණීමයි

මහනුවර මහෙස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද සහ හිමිකරුවන් විසින් නියමිත කාලසීමාවක් තුලදී ඉවත් කර නොගන්නා ලද පහත සඳහන් බඩු 1973 අප්‍රේල් මස 28 වන දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ.

1. 76002 තාච්චි 2යි. බැරල් 1යි.
2. 74088 පින්තාරු රාමු 1යි.
3. ඒ 2951 සෙරෙප්පු කුට්ටම 1යි.
4. 83489 කුඩ 1යි.
5. 83009 මුල්ලුවක්
   දැල් කැල්ලක්
6. 77678 පිත්තල මල් පෝච්චි 1 යි.
7. 84912 කමිස 1 යි.
8. 78335 ලොරි ටියුබ 1 යි.
9. 80583 බයිසිකල් 1 යි.
10. 78714 දෙර ලෑලි කෑලි 11 යි.
    ලී ඇඳන් 1 යි.
11. බී 788 රත්තරන් කරාබු 1යි.
12. මැටි බුජම 4යි.
13. කාර බැරල් 1යි.
14. කටු කම්බි රෝල් 1යි.
15. අංක බීබී 7805 දරණ හම්බර් පා පැදිය.
16. අංක D.F. 13351 දරණ රැලේ පා පැදිය
17. අංක බී 035078 දරන හම්බර් පා පැදිය
18. ටකරන් තහඩු 1යි.
19. 81317 බයිසිකල් 1යි.
20. ඒ2456/72 පිදී වලල්ලක්.
21. ඒ2456 : 72 පදක්කමක් සහිත චේන් එකක්
22. 83961 සන්ලයිට් සබන් කෑලි 22යි.
23. 86499 සූට් කේස් 2 යි.
24. 77528 ත්‍රී පින් ප්ලග් 1යි, හෝල්ඩර් 6යි., සිලින් හෝසස් 3යි, සොයිබ 3යි.
25. 82294 ප්ලාස්ටික් බෑග් 3යි, කාන්තා කුඩ 3යි, ක්ලච් ප්ලේට් 1යි, කතුරු 1යි.
26. ඒ4308 අත් ඔර්ලෝසුවක්
27. 79988 මේස ඔර්ලෝසු 1යි.
28. 80380 ගුවන් විදුලි යන්ත්‍රයක්
29. 79330 ස්ටීරියන් රෝඩ 1යි. ජියර් ලිවර් 1යි.
30. ඒ44/47 සරනේරු 9යි.
31. බී 2922/72 විදුලි පන්දම් 1යි, ගැරොප්පු 1යි, කුප්පි ලාම්පු 1යි. පිඟන් දෙකක් සහ පිරිසියක්, කේතලයක්, තාච්චියක්, මේස හැඳි 3ක්,
32. 82906 ඇස්බැස්ටෝස් පයිප්ප 3යි.
33. 77824 මෙට්ට 1යි.
34. ඒ 2951/72 සෙරෙප්පු කුට්ටම 1යි.
35. 58352 රෙදිවියන බොබින් 186, ෂැටැල් 3යි, පර්න්ස් 7යි.
36. ඒ 4134/72 ගෑස් ලිපක්
37. 4097 පොප්ලින් රෙදියාර 60 යි.
38. ඒ 4087 ලන්තෑරුම 1යි, බාල්දි 1යි.

39 ඒ4448—
   (1) චීත්ත රෙදියාර 211යි.
   (2) පලකුරු දීසි 1යි.
   (3) තේ පෝච්චි 1යි.
   (4) කිරි ජෝගු 1යි.
   (5) සීනි බෝතල් 1යි.
   (6) අත සෝදන කෝප්ප 3යි.
   (7) පෑට් සැලට් දීසි 5 යි.
   (8) ලැමනට් වීදුරු 6යි.
   (9) වයින් වීදුරු 6යි.
   (10) සීනි කෝප්ප 1යි.
   (11) මාලු දීසි 1යි.
   (12) දෙඩම් මිරිකන උපකරන 1යි.
   (13) කේක් ට්‍රේ 1යි.
   (14) පෑට් සැලට් දීසි 9යි.
   (15) සිගරට් අලු බඳුන් 4යි.
   (16) මල්පෝච්චි 2යි.
   (17) බන්දේසි 2යි.
   (18) ජෑම් භාජන 1යි.
   (19) බුලත් තට්ටු 1යි.
   (20) බටර් දීසි 1යි.
   (21) අලි සමග පිත්තල පාත්තර 1යි.
   (22) පිත්තල නයෙක්.
   (23) අත් ඔර්ලෝසුවක්.
40. ජේ 1008 දැකැත්තක්
41. 76412 හුඩ රැක් එකයි.
42. ඒ317/70 සාක්කු ඔර්ලෝසුවක්
43. බයිසිකල් ඉම්පෙලේටර් 2යි.
44. කැති 3යි
45. හිස් කිරි භාජනයක්
46. රට එන්ජින් බ්ලොක් 1යි.
47. 84889 මොනිටර් එක්සැයිස් පොතක්
48. ඒ3965 වප්පිහියක්
49. ඒ4024/72 වේවැල් කූඩයක්, කේතලයක්
50. 78492 හබ කැප් එකයි.
51. බී1249 කාන්තා අත් ඔර්ලෝසුවක්
52. ඒ 1551 කුඩයක්
53. බී 905/70 සීනි බෝල බෝතල 3යි.
54. ඒ 4034/72 උල්පත් පෑනක්
55. ඒ 4088 එයා ක්ලීනර් එකයි.
56. බී 1097 බෙලෙක් කෝප්ප 2යි.
57. ඒ 1476/71 කිනිහිරයක්
58. 83794 අත් ඔර්ලෝසුවක්
59. ඒ 4235 කුඩයක්
60. 79332 සිවුරු 4යි, අඳනා කඩ 4යි, බාබර් පිහියා 1යි.

වෙන්දේසියේදී මිලදී ගන්නා බඩු වලට මුදලින් ගෙවීම කළ යුතු අතර වෙන්දේසි අවසානයේදී එදිනම බඩු ඉවත් කරගත යුතුය. එදින දවල් 12.30ට මෙම භාන්ඩ බැලීමට හැකි වේ.

1973 මාර්තු මස 24 වන දින, ජී. එෆ්. එච්. අතුරුපාන,
මහනුවර, මහේස්ත්‍රාත් උසාවියේ දීය. මහනුවර මහේස්ත්‍රාත්.

4–21—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ලේ/10.

### හම්බන්තොට මහේස්ත්‍රාත් උසාවිය

### රාජ්‍ය සන්තක කළ සහ අයිතිවාසිකම් නොකියන ලද භාණ්ඩ විකිණීම

හම්බන්තොට මහේස්ත්‍රාත් උසාවියේ පවරණ ලද නඩුවල රාජ්‍ය සන්තක කරණ ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 1973 මැයි මස 29 වැනි දින පෙ. ව. 11ට හම්බන්තොට මහේස්ත්‍රාත් උසාවි ගොඩනැගිල්ලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් නිවේදනය කරමි. අයිතිවාසිකම් නොකියන ලද භාණ්ඩ සඳහා අයිතිවාසිකම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට සති දෙකක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

විදුරු 25යි.
පැට්රල් ලාම්පු 1යි.
ලන්තෑරුම 1යි.
විදුලි පන්දම් 4යි.
පොරව 1යි.
කැති 3යි.
පිහි 6යි.
පැන්සල් 2යි.
ස්වේන්ද්‍රා සබන් කැට 2යි.
රාණි සබන් කැට 1යි.
චැම්පියන් ස්පාකින් ප්ලග් 2යි.
ගිනි පෙට්ටි පැකට් 1යි.
බට පෙට්ටි 2යි.
එඳළු 4යි.
රැලේ වර්ගයේ පා පැදි 1යි.
බීඑස්ඒ වර්ගයේ පා පැදි 1යි.
බයිසිකෝ 2යි.
බෙල් 1යි.
පා පැදි ජන්ගා සෝක් කෑලි 1යි.
පා පැදි සීට් කවර 1යි.
පා පැදි මඩ කවර 1යි.
විදුලි පන්දම් බල්බයක්.
වරක්වර් ලොකු ටයර් 3යි.
ලූව හම් 7යි.
මැන්ටල් 3යි.
ගමන් බෑග් 2යි.
කොහු ලණු කැරලි 26යි.
හිස් අරක්කු බෝතල තොගයක්.

(අ) මෙම භාණ්ඩ වෙන්දේසියට පැය භාගයකට පෙරදී පරීක්ෂා කළ හැක.

(ආ) සම්පූර්ණ මුදල ගෙවා භාණ්ඩ, වෙන්දේසිය අවසානයේදී ගෙන යා යුතුයි.

(ඇ) චෙක් පත් භාර ගනු නොලැබේ.

පී. ඇම්. වරුසවිතාන,
1973.03.23 වෙනි දින, මහේස්ත්‍රාත්, හම්බන්තොට.
හම්බන්තොට මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

4–35—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාදා දිනයකම පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමඟ කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති වෙත තැපැල් මගින් එවීමට හෝ පෞද්ගලිකව භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගනුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැල් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩර්යක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නීතුන් කළායයි හැඟෙන ප්‍රකාශන, ශ්‍රේෂ්ඨ උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| මැදිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අගලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින කෙරම සැකසෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළඹවරුන් වෙනම පළවන දැන්වීම් සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති වෙතට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 33 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.

* තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 00 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සැලැස්විය.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්මගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා ගෙවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු ... | 73. 3. 2 සිකුරාද ... | 73. 3.21 බදාද | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද ... | 73. 2.28 බදාද | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද ... | 73. 3. 7 බදාද | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද ... | 73. 3.14 බදාද | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද ... | 73. 3.21 බදාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 6 සිකුරාද ... | 73. 3.28 බදාද | දවල් 12.00 |
| | 73. 4.11 බදාද ... | 73. 4. 4 බදාද | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද ... | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද ... | 73. 4.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.